**මහනුවර ඇසළ පෙරහැර භාරය - 2017**

**-----------------------------------------**

මහනුවර ඇසළ පෙරහැර භාරයේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනතේ 16(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාරව භාරයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් භාරයේ සභාපති වෙත 2018 ජුලි 11 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, භාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2017 දෙසැම්බර් 31 දිනට මහනුවර ඇසළ පෙරහැර භාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 ප්‍රකාරව පිළිගත් ආකෘතියට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

මහා භාරකාරවරයාගේ භාරයේ පවත්නා රු.20,000,000 ක තැන්පතුව සඳහා සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු පොලී ආදායම හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 138 (8) | වවුචරයක් සහතික කිරීමේදී එම වවුචරය සෑම අතින්ම නිවැරදි හා සම්පූර්ණ බවට සහතික කරන නිලධාරියා විසින් සෑහීමකට පත්විය යුතුය. එහෙත් භාරයේ රාජකාරී කටයුතු වෙනුවෙන් යොදාගෙන තිබූ වෙනත් දෙපාර්තමේන්තුවලට අයත් වාහන 3 ක් වෙනුවෙන් භාරය මගින් රු.15,500 ක ඉන්ධන වියදම් දරා තිබුණද එම ඉන්ධන අදාළ ධාවන සටහන්වලට ඇතුළත් කර ඇති බවට සහතික කරගෙන නොතිබුණි. |
| (ආ) 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනත | |
| 8 (1) හා 9 වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිළමේ, සතර මහා දේවාලවල බස්නායක නිලමේවරුන්, මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා සහ ජනාධිපතිවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත උපදේශක කමිටුවක් පත් කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව භාරය පරිපාලනය කිරීමෙහිලා කමිටුවේ සහය ලබාගැනීමට නොහැකි වී තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් / 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය<br>(i) 4.1 ඡේදය | භාරයේ අරමුණුවලට අනුකූලව පිළියෙල කරන ලද අයවැය ලේඛනය පෙර වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| | (ii) 4.2 (ඇ) ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාලව භාරයේ බැංකු ගිණුම් පිළිබඳව කාර්තුමය වාර්තා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iii) 4.3 ඡේදය | කාර්යසාධන වාර්තාව හා අදාළ ගිණුම් වර්ෂය අවසාන දිනට අරමුදලේ බැරට ඇති ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග සැසඳු බවට ප්‍රකාශනයක් මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ භාරයේ මූල්‍ය ප්‍රතිඵලය රු.741,890 අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,916,848 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,174,958 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී ආසන පැනවීමේ ආදායම රු.1,452,500 කින් අඩුවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**4.1 කාර්යසාධනය**

--------------------

**4.1.1 සැලසුම් කිරීම**

--------------

සමාලෝචිත වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් හා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

-----------------------------------

1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනතට අනුව ඉටුකරගත යුතු පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(අ) මහනුවර වාර්ෂික ඇසළ පෙරහැරේ කලාත්මක සහ සංස්කෘතික අගය නංවාලන ජාතික කලා සහ නැටුම් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම

(ආ) මහනුවර වාර්ෂික ඇසළ පෙරහැරේදී උපයෝගී කරගතයුතු භාණ්ඩ නිෂ්පාදනයේ නිරත වීම.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහා භාරකාරවරයා සන්තකයේ තැන්පත් කර තිබූ අරමුදලට අයත් රු.20,000,000 කට අදාළව සහතික පත්‍රයක් පෙරහැර භාරය වෙත 2018 අප්‍රේල් 30 වන දින දක්වාම නිකුත් කර නොතිබුණි. තවද, මහනුවර ප්‍රාදේශීය ලේකම් අමතන ලද, 2008 අගෝස්තු 29 දිනැති ශ්‍රී ලංකාවේ මහා භාරකරුගේ අංක පීටී/5/3/ආර්/30/සීටී/5(i) දරන ලිපියේ 03 ඡේදය ප්‍රකාරව, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ එම වර්ෂයට පවතින පොලී අනුපාතය පදනම් කරගෙන එම තැන්පතුව සඳහා පොලී මුදලක් භාරය වෙත ලබාදෙන බවට දන්වා තිබුණද ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂයට අදාල පොලී මුදල මෙම වාර්තාවේ දින වනවිටත් භාරය වෙත ලබා දී නොතිබුණි.

(ආ) භාරය සතුව 2017 දෙසැම්බර් 31 දින සිට මහනුවර ලංකා බැංකුවේ පවත්වා ගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුමක රු.1,349,870 ක ශේෂයක් හා ජංගම ගිණුමක රු.1,705,446 ක ශේෂයක් පැවති අතර, මෙම ගිණුම්වල වර්ෂය මුළුල්ලේම රු. මිලියනයකට වැඩි ශේෂයන් පැවතියද එම මුදල් ඉහළ පොලී ආදායමක් ලැබෙන ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර භාරයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ලැබිය යුතු පොලී ආදායම් හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම.<br><br>(ii) නිර්වින්දන කටයුතු සඳහා මිලදී ගන්නා ඖෂධ තොගයට ඇතුළත් කිරීමකින් තොරව වියදමක් ලෙස කපා හැරීම හේතුවෙන් වර්ෂ අවසානයට ඉතිරි වී ඇති තොගය ගිණුම්වලින් නිරූපනය නොවීම සහ ඒ සඳහා තොග ලේඛන පවත්වාගෙන නොයාම. |
| (ආ) මූල්‍ය පාලනය | අරමුදල් ඵලදායී ලෙස ආයෝජනය නොකිරීම |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | පැමිණීමේ ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම හා කාර්ය මණ්ඩලයට දෛනික රාජකාරී වෙන් කර නොදැක්වීම |